# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 65 දරන
# දඹදෙණිය සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1992 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 65 දරන දඹදෙණිය සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 46/91

දඹදෙණිය සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"දඹදෙණිය සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරය පිහිටුවීමට අරමුණු කොටගත් පරමාර්ථ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් පිහිටුවාගෙන තිබුණු හෙයින් ද:

එකී භාරයේ කටයුතු සහ පරමාර්ථ එකී භාරය පිහිටුවීමට අදාළ ඔප්පුවට අනුකූලව පත් කරනු ලැබූ භාරකාර මණ්ඩලයක් විසින් මෙතෙක් කල් කළමනාකරණය කොට සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් ද:

එකී භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1992 අංක 65 දරන දඹදෙණිය සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දඹදෙණිය සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) දඹදෙණිය සංවර්ධන පදනමේ භාරකාර මණ්ඩලයේ තත් කාලයේ සාමාජිකයින් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ භාරකාර මණ්ඩලයට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් "දඹදෙණිය සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය කාලීන්කාලීව වෙනස් කිරීමේ සහ ස්වකීය කැමැත්ත සහ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(i) මෙහි මින් මතු "දඹදෙණිය ඡන්ද කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන අලව්ව සහ නාරම්මල උප දිසාපති කොට්ඨාසවලින් සංයුක්ත වන ප්‍රදේශයෙහි ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය සහ මිනිස් සම්පත් සංවර්ධනය සඳහා ධෛර්ය දීම;

(ii) ස්වයං නියුක්ති බිහි කරන ව්‍යාපෘති ඇති කිරීම සඳහා ආධාර කිරීම සහ ඒ ව්‍යාපෘතිවලට කළමනාකරණ සහාය ලබාදීම;

(iii) දඹදෙණිය ඡන්ද කොට්ඨාසයෙහි නිවාස, උපයෝගි සේවා හා පහසුකම් දියුණු කිරීම;

(iv) දඹදෙණිය ඡන්ද කොට්ඨාසයේ සිටින සුදුසු තැනැත්තන්ට අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ලබාගැනීම සඳහා ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ලබාදීම ;

(v) දඹදෙණිය ඡන්ද කොට්ඨාශයේ ශාරීරික අභ්‍යාස හා ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(vi) දඹදෙණිය ඡන්ද කොට්ඨාසයේ පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය සංරක්ෂණය, සනීපාරක්ෂක කටයුතු හා සාමාන්‍ය ශුභ සාධනය නංවා ලීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, අවස්ථාවෝචිත පරිදි එකී රීතිවලට අනුකූලව පත් කරනු ලබන්නා වූ, තෝරා පත්කරනු ලබන්නාවූ හෝ නම් කරනු ලබන්නාවූ ද එකී රීතිවලින් විධි විධාන සලස්වා ඇති සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ ද (මෙහි මින්මතු “ මණ්ඩලය ” යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ධූර දරන භාරයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්, සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ රීති.**

5. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ භාරය පිහිටුවීමට අදාළ වූ ඔප්පුවේ විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කිරීම, පත් කිරීම හෝ නම්කිරීම සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බලතල සහ කාර්ය සහ ඔවුන්ගේ ධූර කාලය ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම් වල දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් පවත්වන දිනයන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැන්වීම්, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කරුණු ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී භාරයේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත යම් ලිඛිත නීතියක හෝ භාරය පිහිටුවීමට අදාළ ඔප්පුවේ හෝ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

6. (1) සංස්ථාවේ අරමුදල පහත දැක්වෙන මුදල්වලින් සංයුක්ත විය යුතු ය:— සංස්ථාවේ අරමුදල

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ අරමුදලේ බැරට තිබෙන සියලු මුදල් භාර කරුවන් වෙත භාර දී; ඒ සියලු මුදල් එදින සිට සංස්ථාව වෙත පැවරෙන්නේ ය;

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් පසු සංස්ථාවට උපචිත වන සියලු මුදල්.

(2) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීමේ දී දරනු ලැබූ වියදම් ගෙවීම සඳහා සංස්ථාවේ අරමුදලේ බැරට ඇති සියලු මුදල් යොදවනු ලැබිය යුතු ය.

7. (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක සහ භාරය පිහිටුවීමේ ඔප්පුවේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කටයුතු සඳහා අවශ්‍ය සියලු දේවල් සංස්ථාවේ නාමයෙන් සිදුකිරීමේ බලය මණ්ඩලය වෙත ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, ඊක්ඨ වරණය කිරීමකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව, වෙත පැවරෙන චංචල හෝ නිශ්චල සියලු දේපළ අත්කර ගැනීම, දැරීම සහ ඒවා වැඩි දියුණු කිරීම;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පැවරීම, පවරා දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරය කින් නියෝජනය කිරීම;

(ඇ) සංස්ථාව සතු මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ වැසීම සහ සංස්ථාවේ දේපළ ඇපයට තබා හෝ ඇපයක් නොමැතිව හෝ සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඈ) මුදල් ලබා ගැනීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය නිලධාරියන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන අනෙකුත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයකුගේ භාරයේ තිබිය යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට ~~තැබිය යුතු~~ අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයේ තම නම ලියා අත්සන් කළ යුතුය. ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු ලෙස කර ඇති අත්සන් කිරීමකට ස්වාධීනව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

9. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.